# 10th Anniversery නුග සෙවණ





එළිමහනේ නුග සෙවණ යට රූපත මැදිරියේදී

ජාති භේදයකින් තොරව සෑම ජනවර්ගයකටම අනන්‍ය වියහැකි පරිදි සැකසෙන නුගසෙවණ සඳහා තෝරා ගන්නා ගීතයන් ද සියුම් අවධානයකට ලක් කෙරේ. නුගසෙවණ රූපී දෙවන බස ව්‍යවහාර කරන ජනතාව සඳහා ආදේශන වැඩසටහනක් ලෙස, "උදය දර්ශනම්" දෙමළ සජීවී වැඩසටහන නුගසෙවණට සමගාමීව විකාශය සිදුවේ. 2000 වසරේ සිට තවත් ඉදිරි පියවරක් තබමින් මැදිරියෙන් බැහැරව නුගසෙවන පිට පළාත් කරා රූගත යාම ඇරඹිණි. එම ප්‍රදේශ වල කාන්තාවන් සඳහා නොමිලේ සිදුකළ නුගසෙවණ උපදේශන වැඩමුළු සඳහා විශේෂ ජනප්‍රසාදයක් ලැබුණි.

වර්තමානයේ ලංකාවේ කාන්තාවන් අතර, ජනප්‍රිය වී සිටින වෛද්‍ය වරුන්, උපදේශකයින්, සූපවේදීන්, රූපලාවන්‍ය ශිල්පීන් හා වෙනත් බහුතරයක් දෙනා කරළියට පැමිණියේ නුගසෙවණ හරහා ය. රූපවාහිනී සංස්ථාවේ වර්තමාන සභාපතිතුමාගේ අදහසක් අනුව ඇරඹුණු "සොඳුරු හෝරාව" නුගසෙවණේ ජනප්‍රියතාව තවදුරටත් ඉහළ නැංවීමට හේතු විය. හදබැඳි කලාකරුවකු සමග ඇරඹෙන මුල් පැය නුගසෙවණ ප්‍රිය කරන කාර්යබහුල කාන්තාවන්ගේ අරුණෝදයට මඳ ඉසිඹුවක් ගෙනදෙන්නක් වී ඇත..

**වැඩසටහනට ලැබුණු ප්‍රතිචාර හා ඉල්ලීම් සළකා නුගසෙවණ ලිඛිත ප්‍රකාශනයක් එළි දැක්වීමට රූපවාහිනිය කටයුතු කළේය. ඒ අනුව 2008 අප්‍රේල් මාසයේදී නුගසෙවණ මුද්‍රිත මාසික සඟරාව එළි දැක්වූ අතර, මේ වන විට එය වඩාත් ජනප්‍රිය කාන්තා මාසික සඟරාව බවට පත්ව තිබේ..**

නුගසෙවණ කෙරෙහි ප්‍රේක්ෂකයින් බැඳී සිටින්නේ එහි ඉදිරිපත් වන දෑ සඳහා පූර්ණ වගකීමක් එම නාලිකාව දරණ බැවිනි. ප්‍රේක්ෂකයා වෙත ගෙන එන ඖෂධ වර්ග, ආලේපන වර්ග ආදිය පිළිබඳ සැළකුවහොත් ඒවා විකාශය කරන්නේ වෛද්‍ය සභාවේ නිර්දේශය සහිත අවසර පත්‍රක් සහිත වේ නම් පමණකි.

නුගසෙවණ තුළින් භාණ්ඩයක් හඳුන්වාදීම සඳහා ඒ පිළිබඳ ලබාගත් තත්ව සහතිකය සොයා බැලේ. පොත පතක් වුවද ප්‍රේක්ෂකයින්ට හඳුන්වා දෙන්නේ එය කිසියම් ඇගයීමකට පාත්‍ර වී ඇත්නම් පමණකි..

වැඩසටහන තුළ ඇති මෙම ගුණාත්මකභාවය හේතුකොට නුගසෙවණ වටා විශ්වාසයකින් යුතුව කාන්තාවන් පෙළගැසී සිටී. ඒ අනුව ලාංකීය ගෘහණියන්ගේ දෛනික ජීවිතයට අත්වැලක් සැපයීමේ යහ අරමුණින් ඇරඹි නුගසෙවණ වර්තමානයේ කාන්තාවන්ගේ අත් පොතක් බවට පත්වී තිබේ. රූපලාවන්‍යය, නවීන විලාසිතා, සූප ශාස්ත්‍ර, ගෘහ කළමනාකරණය සහ ගෘහ අලංකරණය, වෛද්‍ය ගැටලු, ළමා පෝෂණය, ධනාත්මක චින්තනය, නීති උපදෙස්, ශාරීරික ව්‍යායාම ක්‍රම, සංස්කෘතික අවබෝධය ආදී බොහෝ විෂය පථයන් හරහා දේශීය කාන්තාව දිරි ගැන්වීම නුගසෙවණේ අධ්‍යාශය වී තිබේ. නව ලෝකයට කාන්තාව මුහුණ දෙන්නේ කෙසේද, ඒ සඳහා ඔවුන් සන්නද්ධ කළයුතු වන්නේ කුමන අංශ වලින්ද යන්න විමසා බැලෙන නුගසෙවණ ඉදිරියට යන කාන්තාවගේ ධෛර්යය වර්ධනය සඳහා ආකල්ප හා දැනුම දියුණු කරමින් සතියේ දින 05 ක් පුරා විකාශය වේ. වසර 10 ක් පුරා නිෂ්පාදකවරුන් කොතරම් ප්‍රමාණයක් මෙම වැඩසටහන නිෂ්පාදනය කළද එහි ස්වරූපය නොවෙනස් වී ඇත්තේ එය ලාංකීය කාන්තාවට අනන්‍ය වූ වැඩසටහනක් බවට පත්ව ඇති බැවිනි.

**නාමල් ප්‍රසන්න**